ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ජාතක කතා ශ්‍රවණ පුස්තකය පොසොන් පෝ දින එළි දැක්වේ

ඉන්දු - ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හි 75 වන සංවත්සරය නිමිත්තෙන් ජාතක කතා සිංහල ශ්‍රවණ පුස්තකය 2022 ජූනි 14 වන දිනට යෙදුණු පොසොන් පොහොය දින අනුරාධපුර, රුවන්වැලි මහා සෑ රදුන් අභියස දී එළි දැක්විණ. යහපත් ඔවදන් යන තේමාව යටතේ ජාතකට්ඨ කථා අතරින් තෝරාගත් ජාතක කතා 50ක් ඇතුළත් මෙම ශ්‍රවණ පුස්තකය ප්‍රධාන වශයෙන්ම දෘශ්‍යාබාධිත අය වෙනුවෙන් සකසා ඇත. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ තාක්ෂණික සහයෝගීතා අංශයේ උපදේශක සහ කාර්ය මණ්ඩල ප්‍රධානී ආචාර්ය සුෂිල් කුමාර් මහතා විසින් පළමු ශ්‍රවණ පුස්තකය මහා සංඝරත්නය වෙත පිළිගන්වන ලදී.

2. මෙම ශ්‍රවණ පුස්තකය ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ (SVCC) සහ කොළඹ විශ්ව විද්‍යාලයේ සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානයේ (CCIS) ඒකාබද්ධ ප්‍රයත්නයකි.අති පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමියන් විසින් අධීක්ෂණය කරන ලද මෙම ශ්‍රවණ පුස්තකය සඳහා ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය රේවාන්ත් වික්‍රම් සිං, සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ, ජනප්‍රිය රූපවාහිනී නිවේදකයකු වන ආචාර්ය ඩබ්. ඒ. අබේසිංහ සහ ජනප්‍රිය ගුවන් විදුලි නිවේදිකාවක් වන වත්සලා සමරකෝන් යන මහත්ම මහත්මීහු ද දායකත්වය ලබා දුන්හ.

3. වීඩියෝ තාක්ෂණය ඔස්සේ සිංහල භාෂාවෙන් මෙම අවස්ථාව ඇමතූ මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ජාතක කතා ශ්‍රවණ පුස්තකය ඉන්දියානු ජනතාව විසින් ශ්‍රී ලාංකික ජනතාව වෙත පිදෙන ධර්ම දානයක් බව ප්‍රකාශ කළේය. ජාතක කතා ඇතුළු බොදු උරුමය ඉන්දියාව සහ රටවල් රැසක් අතර වැදගත් ශිෂ්ටාචාරමය බැඳීමක් ඇති කර තිබෙන බව ද වසර දෙදහසකට පෙර ඉන්දියාවෙන් බුදු දහම හිමි වූ පළමු රටවල් කිහිපය අතර සිටින ශ්‍රී ලංකාවට ඒ අතරින් ඉතා සුවිශේෂී ස්ථානයක් හිමි වන බව ද එතුමා සඳහන් කළේය. අසල්වැසි රටවල් ද්විත්වය අතර පොදු සංස්කෘතික උරුමය සහ දෙරට ජනතාව අතර බැඳීම් ශක්තිමත් කිරීම සඳහා මෙවන් පියවර ඉවහල් වන බව එතුමා පැවසීය.

4. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බොදු සබඳතා ගැඹුරු කිරීම සඳහා ඉන්දියානු රජය විසින් මෑතක දී පියවර රැසක් ගෙන තිබේ. බෞද්ධ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම උදෙසා ඇමරිකානු ඩොලර් මිලියන 15ක විශේෂ ප්‍රදානයක් ලබා දීම, කුසිනාරා

නුවරට පළමු ජාත්‍යන්තර ගුවන් යානය 2021 වප් පොහොය දින ශ්‍රී ලංකාවේ සිට පියාසර කිරීම සහ 2021 ඔක්තෝබර් මාසයේදී වස්කඩුව රාජගුරු ශ්‍රී සුභූති මහා විහරයේ කපිලවස්තු සර්වඥ ධාතූන් වහන්සේලා ඉන්දියාවේ නගර රැසක ප්‍රදර්ශනය කිරීම යනාදිය එම පියවර අතරින් කිහිපයකි.

***

***කොළඹ***
***2022 ජූනි 17***